## නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර(තාක්ෂණික නොවන), III ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර(තාක්ෂණික නොවන), III ශ්‍රේණිය තනතුරෙහි පවතින පුරප්පාඩුවලට දිස්ත්‍රික් ජනවාර්ගික අනුපාතය මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට මෙම නිවේදනයේ සඳහන් කොන්දේසි සහ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2018.03.16** දින වේ. මෙම විභාගය ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකිතාක් ආසන්න දිනෙක, මෙම නිවේදනයේ සඳහන් නැගෙනහිර පළාතේ නගර හතරකදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් බඳවා ගැනීමේ තරග විභාගය පවත්වනු ලැබේ.

**02. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි ඃ-**

2.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.2 මෙම නිවේදනය අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන්, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ. මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව, සම්මුඛ පරීක්ෂණයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කොට පවත්නා පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් ජනවාර්ගික අනුපාතය මත බඳවා ගනු ලැබේ.

2.2.1 සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. නැගෙනහිර පළාතට අයත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජනවාර්ගික අනුපාතයට අනුව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

i. යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා ඉල්ලුම් කරන ලද සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව නැගෙනහිර පළාතේ යාබද දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජනවාර්ගික අනුපාතයට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

ii. පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජනවාර්ගික අනුපාතය අදාළ කරගත නොහැකි වන විට එහිදී කුසලතා අනුපිළිවෙලින් සුදුස්සන් තෝරනු ලැබේ.

iii. විභාගයේ දී සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජනවාර්ගික අනුපාතය මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

2.2.2 දිස්ත්‍රික්කයට අයත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් ඃ-

දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.

i. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතුය.

හෝ

ii. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතුය.

හෝ

iii. ඔහු නොකඩවා අවුරුදු 05ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

සටහන

I. යම් අයදුම්කරුවෙකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අයදුම්කරුට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු

ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන් උපන් ස්ථානය සහ රාජ්‍ය සේවයේ නිරත වන බැව් සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.)

II. කිසිම අයදුම්කරුවෙකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. ඉහත 2.2.2 යටතේ සඳහන් කරන පරිදි තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි වරක් සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

2.3 මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට යටත් විය යුතු අතර, නැගෙනහිර පළාතේ අවුරුදු 10 ක අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වේ.

2.4 ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමේදී දැනටමත් රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත සුදුසුකම් ඇති අය තම තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ අයදුම් කිරීමේදී ඉහත සඳහන් තනතුරට අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය එම තනතුරෙන් මුදාහැරිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා අනුමත නොකළ අයදුම්පත් ඉදිරිපත් කරන අය මෙම තනතුරට තෝරාගත හොත් නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

2.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 27/88 අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ ලකුණු මට්ටම විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරී ඉටුකිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

**03. වැටුප ඃ-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව, (MN-2-2016)
28,940-10x300-11x350-10x560-10x660- රු. 47,990/- වේ.

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.

**04. බඳවා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් :-**

**4.1 වයස් සීමාව ඃ-**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

**4.2 අධ්‍යාපන සුදුසුකම් ඃ-**

4.2.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුළුව වෙනත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

**සහ**

4.2.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

**සැලකිය යුතුයි - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2018.03.16 වන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

**05. පොදු සුදුසුකම් ඃ-**

5.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

5.2 විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**06. බඳවා ගැනීමේ ක්‍රමය ඃ-**

6.1 නැගෙනහිර පළාත් සභාව සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට, රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2.2 හි සඳහන් විධිවිධානවලට අනුකූලව බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. එහිදී මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබන අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ. ලිඛිත විභාගය පැවැත්වීම, ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ.

6.2 පවත්නා පුරප්පාඩු වලින් 70% ක් විවෘත තරග විභාගයෙන්ද, ඉතිරි 30% සීමිත තරග විභාගයෙන්ද පුරවනු ලැබේ. සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීම් සඳහා සුදුසුකම් ලබන අයගේ සංඛ්‍යාව පුරප්පාඩුවලින් 30% කට අඩුනම් 30% ක් වන සංඛ්‍යාව හා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අතර වෙනසේ ප්‍රමාණය විවෘත තරග විභාගයේ සුදුසුකම් ලැබූ අයගෙන් පුරවනු ලැබේ. මෙහිදී ප්‍රථමයෙන් සීමිත පදනම මත පවත්නා පුරප්පාඩු පුරවනු ලබන අතර, ඒ සඳහා දිස්ත්‍රික් ජන අනුපාතය සලකා බලනු නොලැබේ. ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව විවෘත පදනම මත දිස්ත්‍රික් ජනවාර්ගික අනුපාතය අනුව පුරවනු ලැබේ. පුරප්පාඩු දිස්ත්‍රික් ජනවාර්ගික අනුපාතයට අනුව පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | ජනවර්ගය | | | |
|---|---|---|---|---|
| | සිංහල | ශ්‍රී ලාංකික දෙමළ | මුස්ලිම් | වෙනත් |
| ත්‍රිකුණාමලය | ✓ | ✓ | ✓ | ✓ |
| මඩකලපුව | ✓ | ✓ | ✓ | - |
| අම්පාර | ✓ | ✓ | ✓ | - |

6.3 සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. ඉහත 6.3 පිළිබඳ අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**08. විභාග ගාස්තු ඃ-**

විභාග ගාස්තුව රු. 300/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඒදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකටද මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

**09. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

9.1 විවෘත පදනම යටතේ එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්කරුවෙකු විසින් එක් අයදුම්පතකට වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් යොමු කළ හොත් ඔහු විසින් ඉදිරිපත් කරන සියලුම අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 6.0 සිට 11.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

9.3 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිවැරදිව සම්පූර්ණ කර නොමැති හා අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.4 මෙම නිවේදනයෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.5 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''EX/Rec/18/01''** යන්න සඳහන් කළ යුතුය.

9.6 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 2,92,080 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. **රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් අයදුම්කරන්නේ නම්,** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර එවිය යුතුය.

9.7 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2018.03.16** වැනි දින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ. **(ඉල්ලුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.)**

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**නැගෙනහිර පළාත,**
**අංකඃ 198, ඇතුල් වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**

**10.** අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත. ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය. iii. වලංගු රියදුරු බලපත්‍රය.

**11.** විභාගය පැවැත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් වේ.

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 01 | අම්පාර | 03 |
| මඩකලපුව | 02 | කල්මුණේ | 04 |

සැ.යු. **යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

**12. විභාග පරිපාටිය ඃ-**

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්ණ පත්‍රය | මුළු ලකුණු | කාලය | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතාවය | 100 යි | පැය 01 යි | 40 % |
| භාෂා හැකියාව | 100 යි | පැය 02 ½ යි | 40 % |

**අභියෝග්‍යතාවයඃ-**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්ණ වලින් සමන්විත වේ.

**භාෂා හැකියාව ඃ-**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කීපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්ණ වලින් සමන්විත වේ.

**සටහන ඃ-**

සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචන වල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. මෙම විභාගයෙන් සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්නපත්‍රය සඳහා ලකුණු 40 කට වැඩියෙන් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබාගත යුතුවේ. කෙසේ වෙතත්, ඉහත ලකුණු සීමාව නිසා දැනට පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී, නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් සහ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ එකඟතාවය සහිතව ප්‍රශ්න පත්‍රවල සමත්වීමේ ලකුණු ප්‍රමාණය හා/හෝ සමත්වීමේ ලකුණුවල ප්‍රතිශතය යම් මට්ටමක් දක්වා අඩු කිරීම සඳහා නැගෙනහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාට බලය ඇත.

මෙම නිවේදනයෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

අයි.කේ.ජී. මුතුබණ්ඩා,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.